**පොදු තරඟ කොන්දේසි - ඇමුණුම 01**

I. මෙම තරඟාවලිය සිංහල හා දමිළ යන භාෂා ද්විත්වයෙන්ම පැවැත්විය යුතු අතර ඒ ඒ මාධ්‍යවල දරුවන් නියමිත මාධ්‍යයෙන් පමණක් තරඟ කළ යුතුයි. යම් දමිළ හෝ මුස්ලිම් දරුවෙක් සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන්නේනම් ඒ දරුවාට සිංහල මාධ්‍යයෙන් තරඟ කළ හැකිය. සිංහල මාධ්‍ය සඳහා තරඟ ඉසව් 14 ක් ද, දමිළ මාධ්‍ය තරඟ ඉසව් 10 කින්ද තරඟාවලිය සමන්විත වේ.

II. වයස් කාණ්ඩ පහත සඳහන් පරිදි වේ

| අනු අංකය | වයස් කාණ්ඩය | විස්තරය |
|---|---|---|
| 01 | **අවුරුදු 15 –18**<br>**2004.12.31 සිට 2008.12.30 දක්වා** | (2004.12.31 දින සිට 2005, 2006, 2007, 2008.12.30 දක්වා අතරතුර කාලයෙහි ඉපදුන දරුවන් මෙම වයස් කාණ්ඩය සඳහා ඇතුලත්වේ.)<br>2022. 12. 31   2022. 12. 31<br>2004. 12. 31   2008. 12. 30<br>අවු: 18. 00. 00   අවු: 14. 00. 01 |
| 02 | **අවුරුදු 11 –14**<br>**2008.12.31 සිට 2012.12.30 දක්වා** | (2008.12.31 දින සිට 2009, 2010, 2011, 2012.12.30 දක්වා අතරතුර කාලයෙහි ඉපදුන දරුවන් මෙම වයස් කාණ්ඩය සඳහා ඇතුලත්වේ.)<br>2022. 12. 31   2022. 12. 31<br>2008. 12. 31   2012. 12. 30<br>අවු: 14. 00. 00   අවු: 10. 00. 01 |
| 03 | **අවුරුදු 7 –10**<br>**2012.12.31 සිට 2016.12.30 දක්වා** | (2012.12.31 දින සිට 2013, 2014, 2015, 2016.12.30 දක්වා අතරතුර කාලයෙහි ඉපදුන දරුවන් මෙම වයස් කාණ්ඩය සඳහා ඇතුලත් වේ.)<br>2022. 12. 31   2022. 12. 31<br>2012. 12. 31   2016. 12. 30<br>අවු: 10. 00. 00   අවු: 6. 00. 01 |

iii. සමෘද්ධි කැකුළු ළමා සමාජ සාමාජික සාමාජිකාවන් පමණක් මෙම තරඟයට සහභාගි විය යුතු අතර **<u>සමෘද්ධි බැංකුවේ ගිණුමක් තිබීම අනිවාර්ය වේ. (සමෘද්ධි බැංකුවේ ගිණුමක් නොමැති කිසිම දරුවෙකු තරඟ සඳහා ඉදිරිපත් නොකළ යුතු බවට අවධාරණය කරමි.)</u>** තරඟයේ මූලික අදියර කලාප මට්ටමින් ආරම්භ වීමත් සමඟම සමෘද්ධි බැංකුවල දරුවන් සඳහා ළමා ගිණුම් (කැකුළු / සිසුරක) ආරම්භ වී තිබිය යුතුය. නව ගිණුමක් නම් අවමය රු.500/- ක ශේෂයක් හා පැරණි ගිණුමක් නම්. රු.1,000/-ක අවම ශේෂයක්වත් තිබිය යුතුය. **මෙහි මූලික අරමුණ වන්නේ දරුවන්ගේ ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම වේ**.

iV. තරඟයෙන් තරඟයට බැංකු පොත්, උප්පැන්න සහතිකය ආදි සුදුසුකම් පරීක්ෂා කර බැංකු ගිණුම ආරම්භ කළ දිනය ඇතුලත්ව ලේඛනය සකස් කර කලාප මට්ටමේදී ජයග්‍රාහී දරුවන් ලබා ගන්නා ලකුණු හා සකස්කළ ලේඛනයද සහිතව කළමනාකාර අධ්‍යක්ෂ වෙතත්, ප්‍රාදේශීය තරඟාවලියේදී ජයග්‍රාහී දරුවන් ලබා ගන්නා ලකුණු හා සකස් කළ ලේඛනය දිස්ත්‍රික් සමාජ සංවර්ධන කළමනාකරු වෙතත් දිස්ත්‍රික් තරඟාවලියේදී ජයග්‍රාහී දරුවන් ලබා ගන්නා ලකුණු හා සකස්කළ නාම ලේඛනය **නියමිත දිනට** ප්‍රධාන කාර්යාලය වෙතත් ලැබීමට සැලැස්විය යුතුය.

V. උඩරට නර්තන (ඒකල) හා කණ්ඩායම් තරඟ වලදී **නර්තනයේ යෙදීමට අවශ්‍ය වාදනය සැපයීම සඳහා පෙන්ඩ්‍රයිව් භාවිතා කල හැකිය. (සෞඛ්‍ය හේතුන් මත)**

Vi මීට පෙර වර්ෂ වලදී ජාතික මට්ටමේ තරඟයෙන් ප්‍රථම ස්ථානය හිමිකර ගත් තරඟකරුවෙකු නැවත එම වයස් කාණ්ඩයෙන් තරඟ කිරීමට නොහැකි අතර එක් දරුවෙකුට එක් තනි තරඟ ඉසව්වකට සහ එක් කණ්ඩායම් තරඟ ඉසව්වකට පමණක් සහභාගී විය හැකිය.

**Vii. මුළු තරඟාවලිය පුරාවටම ( කලාප ,ප්‍රාදේශිය, දිස්ත්‍රික්, ජාතික) ජංගම දුරකථන පටිගත කිරීම් ආදිය සම්පූර්ණයෙන්ම තහනම් වේ.**

**Viii.** කලාප, ප්‍රාදේශීය, දිස්ත්‍රික් තරඟයේදී විනිශ්චය මණ්ඩලය සඳහා තුන් දෙනෙක් සහභාගී කරවීම අනිවාර්ය වන අතර නිළ වශයෙන් ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන තෙක් අදාළ නොවන කිසිම අයෙකුට විනිශ්චය මණ්ඩලයේ ලකුණු දැන ගැනීමට සැලැස්වීම නොකළ යුතුය. අදාළ නීති රීති පිළිබඳ විනිශ්චය මණ්ඩලය දැනුවත් කළ යුතුය.

Xi. කලාප තරඟය පැවැත්විමේදි **<u>බැංකු ගිණුමක් නොමැති දරුවෙක් යම් හෙයකින් තරඟයට ඉදිරි පත් වුවහොත් හා යම් අක්‍රමිකතාවක් සිදු වුවහොත් එහි වගකීම කලාප මට්ටමේදි කලාප කළමණාකරු විසින්ද ප්‍රාදේශීය මට්ටමේදි කළමණාකාර අධ්‍යක්ෂ/ මුලස්ථාන කළමණාකරු විසින්ද දිස්ත්‍රික් මට්ටමේදි දිස්ත්‍රික් විෂය කළමණාකරු විසින්ද දැරිය යුතුය.</u>** අදාළ වයස් සීමාව ඉක්මවූ දරුවන් මෙම තරඟාවලිය සඳහා සහභාගී නොවිය යුතුය.

X.තරඟ සඳහා ඉදිරිපත් වන දරුවන් තමන්ගේ අනන්‍යතාවය පිළිබිඹු වන සේ සුදුසු ඇඳුමකින් සැරසී සිටීම අනිවාර්ය වේ. (නර්තන අංග හැර) (උදා:- ගැහැණු දරුවන් ළමා සාරියකින්, පිරිමි දරුවන් ජාතික ඇඳුමකින්.)

xi.අදාළ මට්ටම් වලදී තරඟාවලියේදී තරඟ පැවැත්වීමෙන් ජයග්‍රහණය කරන තරඟකරුවන් පමණක් ඉදිරි තරඟ වලට ඉදිරිපත් කළ යුතු අතර තරඟ අයිතමයන් සඳහා අවම වශයෙන් තරඟකරුවන් / තරඟ කණ්ඩායම් 5 ක් වත් සිටිය යුතුය. ( සියළු තරඟ ඉසව් සඳහා මෙය අදාල වේ.)

xii **<u>ජාතික තරගාවලිය පැවැත්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලැබීම මත</u>** ජාතික තරඟයේදී ජයග්‍රාහී දරුවන් සඳහා මුල්‍යමය ත්‍යාග ඔවුන්ගේ බැංකු ගිණුම් වලට (සිසුරක / කැකුළු) බැර කිරීමට කටයුතු කෙරේ. ජාතික තරඟාවලිය අවසානයේදී අදාළ දිස්ත්‍රික්ක වෙත පහත සඳහන් අයුරින් මුදල් නිදහස් කරනු ඇත. ජාතික තරඟාවලියෙන් පසු ජයග්‍රාහි දරුවන්ගේ ත්‍යාග මුදල් දිස්ත්‍රික් සඳහා යොමු කරන අතර අදාළ දරුවන්ගේ ගිණුම් වලට එම ත්‍යාග මුදල් බැර වු බවට ලිඛිතව ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය. තවද දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රහණය කරන දරුවන් සඳහා ත්‍යාග මුදල් ලබා දීමේදී පහත දි ඇති මුදල් සීමාවන් නොඉක්මවිය යුතු බව වැඩිදුරටත් දන්වමි.

| ස්ථානය | ඒකල | සමුහ |
|---|---|---|
| | ජාතික | ජාතික |
| ප්‍රථම | 10,000/- | 40,000/- |
| දෙවන | 6,000/- | 30,000/- |
| තෙවන | 4,000/- | 20,000/- |
| කුසලතා (දෙකකි) | (එකකට) 1,500/- | (එකකට) 10,000/- |

xiii. තරඟ සඳහා දරුවන් යොමු කිරීමේ දී ව්‍යාජ හා වංචා සහගත කටයුතු කිසිවක් නොවිය යුතු අතර එවැනි අක්‍රමිකතාවයන් ඇති වුවහොත් අදාළ නිලධාරින් සඳහා විනයානුකූල පියවර ගැනීමට සිදුවන බව දන්වමි. විනිශ්චය මණ්ඩලවල තීරණ අවසන් තීරණ විය යුතු අතර කිසිදු නිලධාරියකුගේ බලපෑමක් ඒ සඳහා නොවිය යුතු බව තරයේ අවධාරණය කරමි.

**<u>තරඟ විස්තර - ඇමුණුම 02</u>**

සියලු තරඟ විස්තර පහත වගුවේ ඇති පරිදි වන අතර චිත්‍ර, ළමා කතන්දර, කෙටි නාට්‍ය, ගද්‍ය රචනා, පද්‍ය රචනා සඳහා පමණක් වැඩි විස්තර පහත පරිදි වේ.

I. චිත්‍ර තරඟ විස්තර සඳහා 18" x 14" ප්‍රමාණයේ බ්‍රිස්ටල් බෝඩ් හෝ ඩ්‍රොවින් කඩදාසි භාවිතා කරන්න. එළිය, අඳුර සහ ත්‍රිමාන ලක්ෂණ පිළිබිඹු වන අයුරින් චිත්‍ර සංරචනයක යොදවන්න. ප්‍රකාශන චිත්‍ර පමණක් නිර්මාණය කළ යුතු අතර මෝස්තර චිත්‍ර ඇඳීම නොකළ යුතුය.**<u>ප්ලැටිනම් හා කාබන් පෑන් භාවිතා නොකළ යුතුයි.</u>**

II. ළමා කතන්දර තරඟය සඳහා පැය 3 ක කාලයක් ලබා දී දරුවන්ට තම තේමාව මුලික කර ගත් නිර්මාණශීලී ළමා කතන්දරය ලිවීමට අවස්ථාවක් ලබා දී නිම කළ කෘතිය ලබා ගැනීමෙන් අනතුරුව එය බැංකු සංගම් මට්ටමේදී, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේදී හා දිස්ත්‍රික්, ජාතික මට්ටම්වලදී එම කතන්දර පොත ඉදිරිපත් කළ යුතු වේ. එසේ සකසන ලද පොතේ පසු පිටෙහි ලකුණු දීම සඳහා අදාළ ආකෘතිය භාවිතා කරන්න. (ඇමුණුම අංක - 07) ළමා කතන්දර කෘතිය නිර්මාණය කර භාර ගැනිමේදී එම පරීක්ෂණ මණ්ඩලය, දරුවා විසින් තරඟයට සහභාගී වී නිර්මාණය කළ කෘතියක් බවට සහතික කළ යුතුය.

III. සහතික කළ උප්පැන්න සහතිකය හා ලකුණු ලබා දිමේ ආකෘතිය පොතෙහි නොගැලවෙන සේ අමුනා **"ළමා කතන්දර නිර්මාණය" දිස්ත්‍රික් තරග ප්‍රතිඵල සමග** අදාළ දිනට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු වේ. එසේ පසුව එවන කතන්දර පොත් තරගයෙන් ප්‍රතික්ෂේප වේ.

IV. ළමා කතන්දර තරඟ ඉසව්ව සඳහා ජාතික මට්ටමේ දී දරුවන් ඉදිරිපත් නොකළ යුතු අතර ඔවුන් විසින් නිර්මාණය කරන ලද **"ළමා කතන්දර නිර්මාණය"** (දරුවෙක් තරඟය සඳහා ඉදිරිපත් කරන ළමා කතන්දර පොතේ තරඟකරුගේ නම, වයස් කාණ්ඩය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, හා දිස්ත්‍රික්කය පැහැදිලිව සඳහන් කළ යුතු වේ.)

V. කෙටි නාට්‍ය තරඟ ඉසව්ව සඳහා අදාළ වන **<u>ආධ්‍යාත්මික සංවර්ධනය / සාමාජීය වශයෙන් සමාජයට යහපත් පණිවිඩයක් ලබා දිය හැකි තේමාවක් තෝරා ගත යුතුවන අතර. අවම වේදිකා සැරසැලි යොදා ගත යුතුවේ.(වේදිකාව සූදානම් කිරීම සඳහා විනාඩි 05කට වඩා යොදා ගන්නේනම් ලකුණු අඩු විමට හේතුවක් වේ.</u>**

VI. ගද්‍ය හා පද්‍ය රචනා සඳහාද පැය 2 ක කාලයක් ලබා දී පරිසරය රැක ගැනීම හා ස්වභාව සෞන්දර්ය වර්ණනාත්මකව නිර්මාණය කල යුතුය.

## සිංහල මාධ්‍ය තරඟ ඉසව් - ඇමුණුම 03

| අනු අංකය | තරඟ ඉසව් | වයස් කාණ්ඩය | කාලය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | සරල ගී ගායනය (ඒකල) | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5 | මව් / පිය ගුණ ගීතයක් හෝ දේශාභිමානි ගීතයක් ගැයිය යුතුය. |
| 02 | ශාස්ත්‍රීය ගායනය (ඒකල) | 7 - 10 | විනාඩි 3 - 5 | රාගය - බිලාවල්,කාෆි,ඛමාජ්,භූපාලි මින් එක් රාගයක් ගැයිය යුතුවේ.(අලාප තනාලංකාර සහිතව) |
| | | 11 - 14 | විනාඩි 4 - 6 | රගය - භීම්පලාශ්‍රි,යමන්,දේශ්.තිලක්කාමෝද් (අලාප තනාලංකාර සහිතව) |
| | | 15 - 18 | විනාඩි 5 - 7 | රාගය- බාගේශ්‍රි,මාලකෞන්ස්,බහාර්,ජයජය වන්ති (අලාප තනාලංකාර සහිතව) |
| 03 | ශාස්ත්‍රීය වාදනය | 11 - 14 | විනාඩි 4 - 6 | රාගය- අශාවරි,දේශ්,භූපාලි,භීම්පලාශ්‍රි (අලාප තනාලංකාර සහිතව) |
| | | 15 - 18 | විනාඩි 5 - 7 | රාගය - තිලක්කාමෝද්,ජයජයවන්ති ජෞනපුරි.(අලාප තනාලංකාර සහිතව) තෝරා ගත් එක් වාද්‍ය භාණ්ඩයකින් පමණක් තරඟ කළ යුතුය. වයලීන්, සිතාර්, බටනලා, එස්රාජ් |
| 04 | ජන ගායනය (ඒකල) | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | ආසාතාත්මක හා අනාසාතාත්මක වශයෙන් ඉදිරිපත් කළ යුතුයි.<br>උදා:- 01. සී පද 05.පතල් ගී<br>02. ශාන්ති කර්ම 06.ඔබර ගී<br>03. නෙළුම් ඔසේ 07.වැලපුම් ගී<br>04. රබන් ගී 08.කුරක්කන් ගි<br>මෙයින් ඔබ කැමති ජන ගායනා ශෛලීන් තුනකට අයත් කවි අසාතාත්මකව හා අනාසාත්තමකව ප්‍රාසාංගිකව ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ජන නැටුම්<br>(සමූහ හෝ මිශ්‍ර)<br>(සාම්ප්‍රධායික ජන නැටුම් ආශ්‍රයෙන්) | 7 – 10<br>11 – 14<br>15 - 18 | විනාඩි<br>5 – 7 | නර්තනය - 10<br>ළමා සමාජ දරුවන් විය යුතුයි.කණ්ඩායමේ උපරිම සංඛ්‍යාව 12 ක් විය යුතුය.අවමය 10 විය යුතුය. .) **නර්තනයේ යෙදීමට අවශයය ගායනය වාදනය සැපයීම සදහා පෙන්ඩ්‍රයිව් භාවිතා කල හැකිය. (සෞඛ්‍ය හේතුන් මත) යම් හෙයකින් දරුවන් යොදා ගන්නේනම් ගායනය 02ක් .වාදනය 02 ක් විය යුතුය.** |
| 06 | උඩරට - ඒකල ගැහැණු/පිරිම<br>උකුසා වන්නම<br>ගජගා වන්නම<br>මයුරා වන්නම<br>අසදෘස වන්නම | 11 – 14<br>15 - 18 | විනාඩි 4 - 6 | සාමප්‍රදායික උඩරට නැටුම් සම්ප්‍රධායට අදාළ වන්නමක් විය යුතුයි. ) **නර්තනයේ යෙදීමට අවශයය ගායනය වාදනය සැපයීම සදහා පෙන්ඩ්‍රයිව් භාවිතා කල හැකිය. (සෞඛ්‍ය හේතුන් මත) යම් හෙයකින් දරුවන් යොදා ගන්නේනම් ගායනය 02ක් .වාදනය 02 ක් විය යුතුය.** |
| 07 | පහතරට - ඒකල ගැහැණු /පිරිමි වන්නම් 32 එකක් විය යුතුය. | 11 - 14<br>15 - 18 | විනාඩි 4 - 6 | සාම්ප්‍රදායික පහතරට නැටුම් සම්ප්‍රදායට අදාළ වන්නමක් විය යුතුයි. ) **නර්තනයේ යෙදීමට අවශයය ගායනය වාදනය සැපයීම සදහා පෙන්ඩ්‍රයිව් භාවිතා කල හැකිය. (සෞඛ්‍ය හේතුන් මත) යම් හෙයකින් දරුවන් යොදා ගන්නේනම් ගායනය 02ක් .වාදනය 02 ක් විය යුතුය.** |
| 8 | කථික | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | වැඩසටහනට අදාළ මාතෘකා දි/ලේ කාර්යාලයෙන් සැපයිය යුතුයි. |
| 09 | නිවේදක<br>(වැඩසටහනක් මෙහෙයවීම) | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | කටහඩ / වචන උච්චාරණය / ඉදිරිපත් කිරීම කෙරේ අවධානය යොමු කිරීම. |
| 10 | චිත්‍ර | 7 - 10<br>11 - 14<br>15 - 18 | පැය 03 | පැස්ටල් / දිය සායම් 18” x 14”<br>බ්‍රිසිල් බෝඩ් ඩ්‍රෝවින් කඩදාසි |

| | | | | |
|---|---|---|---|---|
| 11 | ළමා කතන්දර (මාතෘකා විවෘතයි) | 7 - 10 | පැය 03 | වචන 150 - 200 |
| | | 11 - 14 | | වචන 300 - 350 |
| | | 15 - 18 | | වචන 500 - 550 ළමා කතන්දර (මාතෘකා විවෘතයි) ස්වාධීන නිර්මාණාත්මක කථා අංගයක් විය යුතුය. ඒ / 4 කොළ භාවිතා කරමින් සහතික කළ උප්පැන්න සහතිකය හා ලකුණු ලබා දීමේ ආකෘතිය පොතෙහි නොගැලවෙන සේ අමුනා**"ළමා කතන්දර නිර්මාණය"** පොත් පිංචක් ලෙස සකස් කළ යුතුය. |
| 12 | කෙටි නාට්‍ය (සමෘද්ධි වැඩසටහන/අධ්‍යාපනය/සංස්කෘතියට/පරිසරයට/සොබාදහමට අදාලව | | විනාඩි 08 - 10 | උදා:- ප්‍රචාරණ මාධ්‍යක් නොවන හුදු නාට්‍යමය ගුණය ඉස්මතු වන අයුරින් නිර්මාණය විය යුතුය.**<u>අවම වේදිකා සැරසිලි භාවිතා කළ යුතුවන අතර ඒ සඳහාද ලකුණු හිමි වේ. .(වේදිකාව සූදානම් කිරීම සඳහා විනාඩි 05කට වඩා යොදා ගන්නේනම් ලකුණු අඩු විමට හේතුවක් වේ.)සියළුම සමාජිකයින් ගනන 10කි.(රංගනය,ගායනය,වාදනය ඇත්ලත්ව)</u>** |
| 13 | ගද්‍ය රචනා | 7 - 10 | පැය 2 කි | වචන 150 - 200 |
| | | 11 - 14 | | වචන 250 - 300 |
| | | 15 - 18 | | වචන 450 - 500 පරිසරය සුරැකීම හා පරිසරය සම්බන්ධයෙන් රචනා ගොඩනැගිය යුතුය. ගද්‍ය රචනාවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුය. |
| 14 | පද්‍ය රචනා | 7 - 10 | පැය 2කි. | පේලි හතරේ පද පේලි 06 යි. |
| | | 11 - 14 | | පේලි හතරේ පද පේලි 08 යි |
| | | 15 - 18 | | පේලි හතරේ පද පේලි 12 යි |
| | | | | පරිසරය සුරැකීම හා පරිසරය සම්බන්ධයෙන් පද්‍ය රචනාව ගොඩ නැගිය යුතුය. පද්‍ය රචනාවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |

**<u>දමිළ මාධ්‍ය තරඟ ඉසව් - ඇමුණුම 04</u>**

| අනු අංකය | තරඟ ඉසව්ව | වයස් කාණ්ඩය | කාලය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | සරල ගී ගායනය | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5 | මව් / පිය ගුණ ගීතයක් හො දේශාභිමාන ගීතයක් ගැයිය යුතුය. |
| 02 | ජන ගායනය (ඒකල) | 7 - 10<br><br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | ආසාතාත්මක හා අනාසාතාත්මක වශයෙන් ප්‍රාසංගිකව ඉදිරිපත් කළ යුතුයි. (ධීවර ගීත, ගොයම් ගී, ඕංචිලි වාරම්) |
| 03 | ජන නැටුම් (සමුහ හෝ මිශ්‍ර) අම්මන් කුත්තු, කුරහන්, කාවඩි (කෝලාට්ටම් ශෛලීන් ආශ්‍රයෙන් නිර්මාණය කළ යුතුය.) | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 6 - 8 | නර්තනය - 10<br>ළමා සමාජ දරුවන් විය යුතුයි.කණ්ඩායමේ උපරිම සංඛ්‍යාව 12 ක් විය යුතුය.අවමය 10 විය යුතුය. .) **නර්තනයේ යෙදීමට අවශයය ගායනය වාදනය සැපයීම සඳහා පෙන්ඩ්‍රයිව් භාවිතා කල හැකිය. (සෞඛ්‍ය හේතුන් මත) යම් හෙයකින් දරුවන් යොදා ගන්නේනම් ගායනය 02ක් .වාදනය 02 ක් විය යුතුය.** |
| 04 | නිවේදක | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | කටහඬ / වචන උච්චාරණය ඉදිරිපත් කිරීම කෙරේ අවධානය යොමු කිරීම. |
| 05 | කථික | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 -6<br>විනාඩි 5 - 7 | වැඩසටහනට අදාළ මාතෘකා දි/ලේ කාර්යාලයෙන් සැපයිය යුතුය. |
| 06 | චිත්‍ර | 7 - 10<br>11 - 14<br>15 - 18 | පැය 03 | පැස්ටල් / දිය සායම් 18 x 14 බ්‍රිසිල් බෝඩ් ඩ්‍රෝවින් කඩදාසි |
| 07 | ළමා කතන්දර (මාතෘකා විවෘතයි) | 7 - 10 | පැය 03 | වචන 150 - 200 |
| | | 11 - 14 | | වචන 300 - 350 |

| | | | | |
|---|---|---|---|---|
| | | 15 - 18 | | වචන 500 - 550 ළමා කතන්දර (මාතෘකා විවෘතයි) ස්වාධීන නිර්මාණාත්මක කථා අංගයක් විය යුතුය. ඒ / 4 කොළ භාවිතා කරමින් සහතික කළ උප්පැන්න සහතිකය හා ලකුණු ලබා දීමේ ආකෘතිය පොතෙහි නොගැලවෙන සේ අමුනා**"ළමා කතන්දර නිර්මාණය"** පොත් පිංචක් ලෙස සකස් කළ යුතුය. |
| 08 | කෙටි නාට්‍ය (සමෘද්ධි වැඩසටහන/අධ්‍යාපනය/ සංස්කෘතියට/පරිසරයට/ සොබාදහමට අදාලව | විවෘත | විනාඩි 10 - 12 | උදා:- ප්‍රචාරණ මාධ්‍යක් නොවන හුදු නාට්‍යමය ගුණය ඉස්මතු වන අයුරින් නිර්මාණය විය යුතුය.**අවම වේදිකා සැරසිලි භාවිතා කළ යුතුවන අතර ඒ සඳහාද ලකුණු හිමි වේ. .(වේදිකාව සූදානම් කිරීම සඳහා විනාඩි 05කට වඩා යොදා ගන්නේනම් ලකුණු අඩු වීමට හේතුවක් වේ.)සියළුම සමාජිකයින් ගනන 10කි.(රංගනය,ගායනය,වාදනය ඇත්ලත්ව)** |
| 09 | ගද්‍ය රචනා | 7 - 10 | පැය 02 කි | වචන 150 - 200 |
| | | 11 - 14 | | වචන 250 - 300 |
| | | 15 - 18 | | වචන 450 - 500 පරිසරය සුරැකීම හා පරිසරය සම්බන්ධයෙන් රචනා ගොඩනැගිය යුතුය. ගද්‍ය රචනාවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුය. |
| 10 | පද්‍ය රචනා | 7 - 10 | පැය 02 කි | පද පේළි හතරේ පද පේළි 06 යි |
| | | 11 - 14 | | පද පේළි හතරේ පද පේළි 08 යි |
| | | 15 - 18 | | පද පේළි හතරේ පද පේළි 12 යි |
| | | | | පරිසරය සුරැකීම හා පරිසරය සම්බන්ධයෙන් පද්‍ය රචනාව ගොඩ නැගිය යුතුය. පද්‍ය රචනාවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුය. |

## කාල රාමුව, ක්‍රියාත්මක කිරීමේ වගකීම හා අනුමත කිරීම - ඇමුණුම 05

ඉහත දක්වා ඇති පරිදි සිංහල හා දමිළ මාධ්‍ය තරඟ බැංකු සංගම්, ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ ඒ මට්ටම් වලදී අදාළ නිළධාරින් විධිමත්ව තරඟය පැවැත්වෙන බවට වගබලා ගත යුතුය.

| අදියර | ක්‍රියාත්මක කිරීමේ වගකීම හා අනුමත කිරීම | පැවරෙන වගකීම | තරගය පැවැත්විය යුතු කාලය |
|---|---|---|---|
| කලාප මට්ටම | වසමේ සමෘද්ධි සංවර්ධන නිළධාරි/සමාජ සංවර්ධන සහකාර/ සමෘද්ධි කලාප කළමනාකරු | • සහභාගිවන තරඟ කරුවන් සඳහා බැංකු ගිණුම විවෘත කිරීම.<br>• උප්පැන්න සහතිකය පරික්ෂා කිරීම හා ජයග්‍රාහී නාම ලේඛන සකස් කිරීම<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2022.06.20 වන දිනට පෙර ලබාදීම සම්බන්ධව වගකිම ගැනීම.<br>• අධීක්ෂණය සඳහා කළමනාකාර අධ්‍යක්ෂ හෝ මුලස්ථාන කළමනාකරු සහභාගි විය යුතුවේ. | 2022 ජුනි 10 පෙර |
| ප්‍රාදේශීය මට්ටම | ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම් මූලස්ථාන කළමනාකරු / කළමනාකාර අධ්‍යක්ෂ / සමාජ සංවර්ධන සහකාර | • බැංකු ගිණුම් උප්පැන්න සහතිකය පරික්ෂා කිරීම.<br>• කලාපයෙන් ලබා දුන් ජයග්‍රාහී නාම ලේඛන පරික්ෂා කර නිවැරදි නාමලේඛන අනුව තරඟාවලිය පැවැත්වීම<br>• ජයග්‍රාහී නාම ලේඛන සකස් කිරීම<br>• එම නාම ලේඛන දිස්ත්‍රික්කය වෙත 2022/08/10 දිනට පෙර ලබා දීම සම්බන්ධව වගකිම ගැනීම. | 2022 ජුලි 30 ට පෙර |
| දිස්ත්‍රික් මට්ටම | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ සමාජ සංවර්ධන විෂය කළමනාකරු, | • බැංකු ගිණුම් උප්පැන්න සහතික පරික්ෂා කිරීම.<br>• ප්‍රාදේශීය කාර්යාලයෙන් ලබාදුන් ජයග්‍රාහී නාම ලේඛන පරික්ෂා කර නිවැරදි නාම ලේඛන අනුව තරඟාවලිය පැවැත් වීම<br>• ජයග්‍රාහී නාම ලේඛන සකස් කිරීම<br>• එම නාම ලේඛන ප්‍රධාන කාර්යාලය වෙත 2022/10/10 දිනට පෙර ලබා දීම සම්බන්ධව වගකිම ගැනීම.<br>• අධීක්ෂණය සඳහා සමාජ සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රාදේශීය කාර්යාලයේ විෂයට සම්බන්ධ වූ කළමණාකරුවන් සහභාගී විය යුතුවේ. | 2022 අගෝ.30 ට පෙර |
| ජාතික මට්ටම | සහකාර අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන හා පරිසර), අංශයේ සියලුම නිළධාරීන් | බැංකු ගිණුම්, උප්පැන්න සහතිකය, ජයග්‍රාහී නාම ලේඛන පරික්ෂා කර ජාතික තරඟාවලිය පැවැත් වීම. | 2022 ඔක්තෝ. 30 ට පෙර |
| ජාතික උත්සවය | සහකාර අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන හා පරිසර), අංශයේ සියලුම නිළධාරීන් | ජාතික තරඟාවලියෙන් තෝරා ගන්නා ජයග්‍රාහකයින් ඇගයීම. | 2022 දෙසැම්බර් |

මෙම තරඟාවලිය පැවැත්වෙන කාල සිමාවන් තුලදි ඉහත පරිදි අදාල නිලධාරින් වගකීම් ගැනිම අනිවාර්ය වන අතර අදාළ තරඟාවලි පැවැත්වෙන දිනවලදී සඳහන් කර ඇති පරිදි නිළධාරි නියෝජනයක් සහභාගි කර වීම අනිවාර්ය වේ.

1)දිස්ත්‍රික් මට්ටම දක්වා තරඟ පැවැත්වීමෙන් අනතුරුව ඒ ඒ තරඟ ඉසව් වලින් , අදාළ වයස් කාණ්ඩ වලින් ප්‍රථම ස්ථානය දිනා ගත් දරුවන් ජාතික තරඟය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

2).ඉහත කාල පරිච්ඡේදයට අනුව තරඟාවලියේ අදාළ මට්ටම් නිම කළ යුතු අතර දිස්ත්‍රික් තරඟයේ තරඟ ප්‍රතිඵල 2022.10.10 වන දිනට ප්‍රථම දී ඇති ආකෘතියට අනුව පැහැදිලිව සකස් කර ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන හා පරිසර අංශය වෙත එවිය යුතුය.

3).ජාතික තරඟය සඳහා නාමලේඛන ඉදිරිපත් කිරීමේදී තරඟකරුවන්ගේ නම් නිවැරදිව සටහන් කර එවීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. දරුවන්ගේ නම් වල මුලකුරු ඉංග්‍රිසි අක්ෂර වලින් සටහන් කළ යුතුය. දමිළ මාධ්‍ය දරුවන්ගේ සම්පූර්ණ නම් ඉංග්රිසි මාධ්‍යයෙන් හා දමිළ මාධ්‍යයෙන් එවීමට කටයුතු කරන මෙන් ඉල්ලමි. **(පහත ආකෘතිය භාවිතා කරමින් පමණක් අදාළ තරඟ ප්‍රතිඵල එවීමට කටයුතු කළ යුතු බවට අවධාරණය කරන අතර මින් පරිබාහිරව එවනු ලබන කිසිදු ප්‍රතිඵල ලේඛනයක් බාර නොගන්නා බව වැඩිදුරටත් දන්වමි.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා / ලේ / කොට්ඨාශය | තරඟ ඉසව්ව | වයස් කාණ්ඩය | තරඟකරුගේ නම | ලබා ගත් ස්ථානය |
|---|---|---|---|---|---|---|
| ඒකල තරඟ සඳහා | | | | | | |
| 01 | ගම්පහ | ගම්පහ | කථික | 7 - 11 | ඒ.ඩී.ඉෂිනි භාෂිකා කොතලාවල | ප්‍රථම |
| කන්ඩායම් තරග සඳහා | | | | | | |
| 02 | මාතර | මාතර | ජන නැටුම් (සමුහ / මිශ්‍ර) | 15 - 18 | ඒ.ඩී.නයනා අනුත්තරා පෙරේරා | ප්‍රථම |
| | | | | | අත්වැල් ගායනා සඳහා නම් ද මේ අයුරින් 1 - 16 දක්වා නිවැරදිව සටහන් කරන්න. | |

**විනිශ්චය මණ්ඩලය තෝරා ගැනීම හා අනුමත කිරීම**

බැංකු සංගම්, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටම්වලදී තරඟ අංශ විනිශ්චය කිරීම සඳහා ඒ ඒ විෂයන් සඳහා ඒ ඒ විෂයන් සඳහා නිපුණතාවයකින් යුතු නිළධාරීන් පත් කර ගත යුතු අතර එසේ පත් කර ගන්නා විනිශ්චය මණ්ඩලය ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත කළ යුතු වේ.

**ප්‍රතිපාදන**

වසම් මට්ටමේදි හා බැංකු සංගම් මට්ටමේ තරග සඳහා උපරිම රු.15,000/- ක් ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ තරඟ සඳහා රු. 25,000/- ක උපරිමයකට යටත්ව ප්‍රජා මූල සංවිධාන හරහා සමාජ සංවර්ධන පදනමින් වියදම් දැරීමට අනුමැතිය ලබා දෙමි. දිස්ත්‍රික් තරඟ සඳහා වියදම් ඇස්තමේන්තුව ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කෙරේ.